මගේ අංකය ;- MPS/01/07
எனது இல ;-
My No :-
ඔබේ අංකය :-
உனது இல :-
Your No :-

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව -** මාලිම්බඩ
**மாலிம்பட பிரதேச சபை - மாலிம்பட**
**MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA**

දිනය :- 2022.08.15
திகதி :-
Date :-

දු.ක./ෆැක්ස් தொலைபேசி/ தொலைநகல் Telephone / Fax:- 041-2240208

## මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
## 2022.08.09 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා
ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 අගෝස්තු මස මාසික සභා රැස්වීම 2022.08.09 දින ගරු සභාපති සෝමසිරි වීරමන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

***01.පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.***

2022 ජූලි මස 12 වන දින පැවති මහා සභාවේ වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව 2022.07.12 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

2022 ජූලි මස 02 වන දින පැවති විශේෂ සභාවේ වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව 2022.07.02 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

***02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන***

***03. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.***

- පහලගොඩ, ඇල්ගිරිය, තෙලිජ්ජවිල හි ගම්වාසීන් විසින් ඉදිරිපත් කරන ලද "මාර්ගය අවහිර වන ලෙස වැටක් බැඳීම සම්බන්ධවයි " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- Maribo Trading company මගින් එවන ලද "අඳුරට සංවේදී ස්වයංක්‍රීයව දැල්වෙන ආලෝක සංවේදී ස්විචය " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- තෙලිජ්ජවිල, උනින්දුවෙල, සුමනාරාමය හි පූජ්‍ය මාකඳුරේ විමලසිරි හිමියන් විසින් එවන ලද "දහම් පාසලට ඩෙස් බංකු ලබා ගැනීම " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- උනින්දුවෙල ගම් වාසීන් විසින් ඉදිරිපත් කර තිබූ " මාර්ගය බාදනය වීම නිසා එය සැකසීම " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- දවටගහහේන, අකුරුගොඩ, සුල්තානාගොඩ හි බී.මහින්ද යන අය විසින් ඉදිරිපත් කර තිබූ "අධ්‍යාපන ආධාර ලබා ගැනීම" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- සභාපති,නාපේ ග්‍රාම සංවර්ධන සමිතිය, මාලිම්බඩ මගින් එවන ලද "ජල නල එලීමෙන් මාර්ගයට සිදු වී ඇති හානිය පිළිබඳව දැනුවත් කිරීම " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- පාසල් සංවර්ධන සමිතිය, මාර/මාලිම්බඩ ශ්‍රී සුමේධ ම.වි.මගින් එවන ලද ", මාර/මාලිම්බඩ ශ්‍රී සුමේධ මහා විද්‍යාලය සඳහා ඉඩම අත්පත් කර ගැනීම " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- නො.190, සෙන්ට්‍රල් පාර්ක් මාලිම්බඩ හි හේවා ලොකුගේ චන්ද්‍රා යන අය විසින් ඉදිරිපත් කර තිබූ "ජල ටැංකිය ආරක්ෂිත ලෙස සකසා ගැනීම සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මාලිම්බඩ මගින් එවන ලද "ජලභීතිකා එන්නත්කරණ වැඩසටහන සඳහා කම්කරු මහතෙකුගේ සේවය ලබා ගැනීම" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- විෂය අංක MPS/2/7,MPS/3/5,MPS/3/6 දරන නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද පසුගිය සභා වාර්තාවෙහි ප්‍රගතිය සම්බන්ධ ලිපි සභාගත කරන ලදී.

***04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත.***
***05. යථා පරිදි කල්දී ඇති යෝජනා***

**<u>යෝජනා අංක 5:1</u>**
2022/06/28 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:1**

2022/06/28 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**යෝජනා අංක 5:2**

2022/07/07 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:2**

2022/07/07 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**යෝජනා අංක 5:3**

2022/07/12 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:3**

2022/07/12 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**යෝජනා අංක 5:4**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළ බදු/බලපත්‍ර ගාස්තු අයකිරීම ඇමුණුමේ සඳහන් පරිදි සිදු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඉහත යෝජනාවට අදාළ ඇමුණුමෙහි සඳහන් වරිපනම් බදු, වෙනත් ගාස්තු,කසළ ගාස්තුව සහ දැන්වීම් පුවරු ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීමටත්, අනෙකුත් ගාස්තු ඇමුණුමේ සඳහන් ආකාරයට අය කිරීමටත් යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.**
**2023 වර්ෂය සඳහා වරිපනම්බදු අය කිරීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභාපනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර මාලිම්බඩ ප්‍රදේශීය සභාව විසින් 20................දින තීරණ අංක ................ යටතේ වරිපනම් කාර්යය සම්බන්ධයෙන් මෙහිදී පහත සඳහන් යෝජනාවේ සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. වරිපනම් නියම කිරීමේ කාර්යය සඳහා ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ නියමයන් සම්පූර්ණ කර ඇති බව වැඩි දුරටත් දන්වමි.

ඉහත කී වර්ෂයට අදාළ සම්පූර්ණ වරිපනම් මුදල 2023 ජනවාරි මස 31 දින හෝ එදිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් ඒ මුදලෙන් (10%) ක වට්ටමක්ද කිසියම් කාර්තුවකට අදාළ වරිපනම් මුදල ඒ කාර්තුවේ පළමුවන මාසය අවසන් වීමට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් ඒ කාර්තුවේ මුදලෙන් (5%) වට්ටමක්ද ගෙවනු ලබන බවත් ඒ ආකාරයෙන් යම් වට්ටමක් ලබා ගැනීමට හැකි වන්නේ අදාල කාලයට පෙර පැවති හිඟ වරිපනම් වේ නම් ඒ හිඟයද ගෙවා අවසන් කළහොත් පමණක් බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

තවද, යතෝක්ථ වරිපනම් බද්ද ගෙවීම පැහැර හැරියහොත් සෑම කාර්තුවක් අවසානයේදීම හිස් ඉඩම් සහ පදිංචිය සඳහා යොදාගන්නා දේපල සඳහා 15%ක් හා හිස් ඉඩම් හා පදිංචිය සඳහා යොදාගන්නා දේපළ හැරුනුවිට සෙසු දේපල වලට 20% බැගින් වන දඩයක් අයකරන බවත්වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ

**සෝමසිරි වීරමන්**
**සභාපති,**
**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**

2022.................. දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

1987 අංක 15 දරන සභා පනතේ 134 වන වගන්තියේ (1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් වරයාගේ අනුමැතිය ඇතිව මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් දියුණු කල ප්‍රදේශයක් /ප්‍රදේශ බවට ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශයේ /ප්‍රදේශ වල පිහිටා ඇති නිශ්චල දේපළ වල සහ ඒ ඒ පන්තියට හෝ වර්ගයට අයත් නිශ්චල දේපළවල 2019 වර්ෂය තුල සංශෝධනය කළ වාර්ෂික වටිනාකම් 2023 වර්ෂය සඳහා එකී පනතේ 146 වන වගන්තියේ නියමය පරිදි සම්මත කිරීමටත්,

ඉහත කී 134 වන වගන්තියේ (1) වන උප වගන්තියේන් ලැබී ඇති බලතල යටතේ එකී නිශ්චල දේපළ අතරින් කුඹුරු ඉඩම් හැර සෙසු සියලුම නිවාස වල ,ගොඩනැගිලවල,ඉඩම් වල හා ගෙපත් වල වාර්ෂික වටිනාකමෙන් සියයට දහයක (10%) ක වරිපනමක් 2023 වර්ෂය සඳහා නියම කිරීමටත් ,සහ

එකී වරිපනම් ,එකී වර්ෂයේ මාර්තු 31,ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුලදී සමාන වාරික හතරකින් ගෙවන ලෙසට 134 වන වගන්තියේ (6) වන වගන්තිය යටතේ විධානය කිරීමටත් ......................... දින තීරණ අංක .................. යටතේ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යොජනා කරන්නීය.

## <u>මාලිම්බඩ ප්‍රාදේශීය සභාව</u>
## <u>2023 වර්ෂය සඳහා වෙනත් ගාස්තු</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ විදිවිධාන වලට යටත්ව මාලිම්ඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂය සඳහා පහත උප ලේඛනයේ දැක්වෙන වෙනත් ගාස්තු ප්‍රමාණයන් අය කළ යුතු බවට .............................. වැනි දින තීරණ අංක ............. යටතේ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**සෝමසිරි වීරමන්**
**සභාපති,**
**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**

2022....................... දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

| උප ලේඛණය | රු. ශත |
|---|---|
| 1. ඒට් පෝරම ගාස්තු | 500.00 |
| 2. ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු | 1500.00 |
| 3. අනතුරුදායක ගස් කැපීමේ ගාස්තු - | |
| කොස් ගසක් සඳහා | 750.00 |
| තේක්ක, මැහෝගනී, පොල් යන ආදි දැව වටිනාකමක් ඇති ගස් | 500.00 |
| වෙනත් ගසක් සඳහා | 300.00 |
| (වැඩිවන ගසකට 150 බැගින්) | |
| 4. වීරීරේබා හා නොපරවා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තු | 500.00 |
| 5. ඉඩම් අනුබෙදුමක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තු | 500.00 |
| 6. ගොඩනැගිලි අයදුම්පතක් කාලය දීර්ඝ කිරීම සඳහා - එක් වර්ෂයකට | 5000.00 |
| 7. නාගරික සංවර්ධන බල ප්‍රාදේශයට අයත් නොවන ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතික අයදුම්පත්‍ර ගාස්තු | |
| නාගරික සංවර්ධන බල ප්‍රදේශයට අයත්වන | 5100.00 |
| නාගරික සංවර්ධන බල ප්‍රදේශයට අයත් නොවන | 5100.00 |
| 8. ගොඩනැගිලි සංවර්ධන බල ප්‍රදේශයට අයත් වන ( නාගරික බල ප්‍රදේශයට අයත් නොවන) | |
| වර්ග අඩි 500 ට අඩු | 600.00 |
| වර්ග අඩි 501 සිට 1000 දක්වා | 1000.00 |
| වර්ග අඩි 1001 සිට 1500 දක්වා | 1500.00 |
| වර්ග අඩි 1501 සිට 2000 දක්වා | 2000.00 |
| 2000 ට වැඩි සෑම වර්ග අඩි 100කට හෝ ඉන් කොටසකට | 200.00 |
| 9. බිම් කට්ටි අනුමත කිරීමේ ගාස්තු (නාගරික බල ප්‍රදේශයට අයත් නොවන) | |
| පර්: 06 – 20 දක්වා | 1000.00 |
| පර්: 21 – 40 දක්වා | 2000.00 |
| පර්: 41 – 60 දක්වා | 3000.00 |
| පර්: 61 – 120 දක්වා | 5000.00 |
| පර්: 121 – 160 දක්වා | 6000.00 |
| 161 ට වැඩි වන සෑම පර්. 01 ක් ඉන් කොටසකට | 500.00 බැගින් |
| 15. ජල නල එළීම සඳහා සහතික නිකුත් කිරීමේ ගාස්තු | 1000.00 |
| ආරක්ෂිත ඇප තැන්පතු | 2000.00 |

| | රු. ශත |
|---|---|
| 16. පරිසර බලපත්‍ර ගාස්තු | 4500.00 |
| මුද්දර ගාස්තු 10% ඇතුළත්ව | |
| 17.පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තුව | 3000.00 සිට ඉහළට |
| 18.පරිසර බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පතක් සඳහා | 500.00 |
| 19.පරිසර බලපත්‍ර අලුතින් අයදුම් කිරීමේ පෝරම ගාස්තු | 500.00 |
| 20.පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීමේ ඇප තැන්පතුව | |
| පාසල් ළමුන් සඳහා | 100.00 |
| වැඩිහිටි සාමාජිකත්වය සඳහා | 150.00 |
| 21.පුස්තකාල අයදුම්පත් ගාස්තු | 10.00 |
| සාමාජිකත්වය අළුත් කිරීම වර්ෂ 05 කට වරක් ගාස්තුව | 100.00 |
| 22.ජල බවුසරය ලබා දීම (දිනකට) | 3500.00 |
| වැඩිවන දිනක් සඳහා | 500.00 |
| බල ප්‍රදේශයෙන් පිටත | |
| කි.මී 1 - කි.මී 5 දක්වා | 1000.00 |
| කි.මී. 5 - කි.මී. 10 දක්වා | 2000.00 |
| ඊට වැඩිවන සෑම කි.මී. 1 ක් සඳහා | 500.00 |
| 23.වරිපනම් සහතික ගාස්තු | 300.00 |
| 24.ව්‍යාපාර හා වෙනත් සහතික ගාස්තු | 200.00 |
| 25.පාපැදි නිකුත් කිරීමේ පෝරම ගාස්තු | 20.00 |
| 26.ට්‍රැක්ටරය කුලියට දීමේ ගාස්තු (දිනකට) | 5500.00 |
| 27.ලොකු ගල් රෝල කුලියට දීම (පැය 08 කට) | 8000.00 |
| වැඩිවන පැයකට | 810.00 බැගින් |
| 28.ලොකු ගෑස් ලිප බදු දීම (දිනකට) | 500.00 |
| 29.කි.ග්‍රෑම් 50ක බත් උයන පියන සහිත සාස්පාන බදි දීම (දිනකට) | 350.00 |

| | |
|---|---|
| 30. ලොකු තාච්චි 01 බදු දීම (දිනකට) | 250.00 |
| 31.ඇළුමිනියම් වතුර උණු කරන ලොකු කේතලය බදු දීම (දිනකට) | 100.00 |
| 32.පස් කපන යන්ත්‍රය පැයකට | 6000.00 |
| 33.ටිපර් රථය දිනකට (පැය 08) | 25000.00 |
| 34.පොදු වෙළෙඳපොළවල් බදු දීම - වාණිජ නොවන(දිනකට) | 1000.00 |
| - වාණිජ | 5000.00 |
| 35.සමර් හට් එකක් බදු දීම සඳහා (දිනකට) | 1000.00 |
| ටකරන් මඩුව කුලියට දීම | |
| 10×20 මඩුව සඳහා -දිනකට | 700.00 |
| I. දින දෙකක් සඳහා | 1000.00 |
| 10×40 මඩුව සඳහා - දිනකට | 1050.00 |
| II. දින දෙකක් සඳහා | 1500.00 |
| 36.ජංගම වෙළඳාම හා ජංගම ප්‍රචාරණ කටයුතු සඳහා ගාස්තු සැහැල්ලු වාහන | |
| හා වෙනත් | 500.00 |
| බර වාහන | 1000.00 |
| 37.ශ්‍රවනාගාරය ලබාදීම | රැස්වීම් සඳහා |
| | රු. ශත |
| 38. රාජ්‍ය ආයතන - දින 01(පැය 08) | 5000.00 |
| (සුබ සාධන සේවා) | 1000.00 |
| පෞද්ගලික - දින 01 (පැය 08) | 15000.00 |
| ආරක්ෂිත ඇප තැන්පතුව (පෞද්ගලික අංශයට පමණි) | 2500.00 |
| 39.ජලනල ඒලීම සඳහා මාර්ග පළුදු කිරීම - දික් මීටරයකට | |
| බොරළු මාර්ගය හරහා පළුදු කිරීම | 520.00 |
| බොරළු මාර්ගය ඉවුර පළුදු කිරීම | 246.00 |
| මාර්ග දිගේ ඉවුර පළුදු කිරීම | 164.00 |
| කොන්ක්‍රීට් හා තාර පාර හරහා පළුදු කිරීමට ගාස්තු | 520.00 |
| ඒ සඳහා තැන්පතු | 2500.00 |
| 40.ජල ටැංකිය(ප්‍රවාහනය නොමැතිව) | 500.00 |
| 41.ජල මෝටරය(ප්‍රවාහනය නොමැතිව) | 3000.00 |

## මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
## කසල ගාස්තුව - 2023 වර්ෂය

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සහ 126(ix)ආ වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල මත මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් 2008 දෙසැම්බර් මස 23 වැනි දින සම්මත කර ගත් පොදු අතුරු ව්‍යවස්ථාව අනුව කසල ශෝධන සේවාව සලසනු ලබන දැහැමි මාවත, මැජෙස්ටික් කෝට් ගම්මානය, මාලිගාතැන්න ගම්මානයේ ආරම්භක කොටස්, අලස්වත්ත ගම්මානය, කොලේජ්වීව් ගම්මානය, මැදගොඩ ඇතුළු කසල එකතු කිරිමේ විශේෂ ව්‍යාපෘතියට ඇතුළත් වීමට කැමති ප්‍රදේශ හා මාර්ගවල පදිංචිකරුවන් ගෙන් පහත උප ලේඛනයේ සඳහන් ගාස්තු පනවා අය කළ යුතු බවට,.................. දින තීරණ අංක ........ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**සෝමසිරි වීරමන්**
**සභාපති,**
**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**

2022................... දින,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

1. වරිපනම් අය නොකරන වර්ගීකරණය කර දෙනු ලබන කසළ සඳහා නිවසකින් මසකට රු. 100/- (වාර්ෂිකව රු. 1000/-)

2. වර්ගීකරණය නොකරන ලද කසළ සඳහා නිවසකින් මාසිකව රු. 300/- (වාර්ෂිකව රු. 3000/-)
3. වෙන් කරන ලද කසළ සඳහා ව්‍යාපාරික ස්ථානයකින් මසකට රු. රු. 200/- (වාර්ෂිකව රු.2000/-)
4. වෙන් නොකරන ලද කසළ සඳහා ව්‍යාපාරික ස්ථානයකින් මාසිකව රු. 450/- (වාර්ෂිකව රු.4500/-)
5. වෙන් කරන ලද කසළ සඳහා මධ්‍ය පරිමාණ කර්මාන්තයකින් මසකට රු. 300/- (වාර්ෂිකව රු.3000/-)
6. වෙන් නොකරන ලද කසළ සඳහා මධ්‍ය පරිමාණ කර්මාන්තයකින් මසකට රු. 1000/- (වාර්ෂිකව රු.10000/-)
7. මහා පරිමාණ කර්මාන්තශාලාවකින් වෙන් කරන ලද කසල සඳහා මාසිකව රු.2500/- (වාර්ෂිකව රු. 25000/-)
8. වෙන් නොකරන ලද කසල සඳහා මහා පරිමාණ කර්මාන්ත ශාලාවකින් මසකට රු. 7000/- (වාර්ෂිකව රු.70000/-)

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:4</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට අදාළ බදු/බලපත්‍ර ගාස්තු අයකිරීමේදී සංශෝධනය කරන ලද වරිපනම් බදු, වෙනත් ගාස්තු, කසල ගාස්තු සහ දැන්වීම් පුවරු ගාස්තු අයකිරීමටත්, ඇමුණුමේ සඳහන් කර තිබෙන අනෙකුත් ගාස්තු ඇමුණුමේ සඳහන් පරිදි අයකිරීමටත් තීරණය විය.

**<u>යෝජනා අංක 5:5</u>**

ප්‍රාදේශීය සභාව සතු තෙලිජ්ජවිල පුස්තකාල ගොඩනැගිල්ලේ එක් කාමරයක ආයුර්වේද බෙහෙත් ලබා දීම සඳහා සායන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

ආයුර්වේදය දෙපැත්තක දැම්මම බල ප්‍රදේශයටම ලොකු සේවයක් වෙනවා.හොරගොඩ, ඇල්ගිරිය, සුල්තානාගොඩ ප්‍රදේශවල අයට තෙලිජ්ජවිලින් බෙහෙත් ගන්න පුලුවන්.ඊට අමතරව අපි තෙලිජ්ජවිල යෝග සායනයක් , රොගී ප්‍රතිකාර සායනයක්,බෝ නොවන රෝග සායනයක්, ප්‍රජාව දැනුවත් කිරීමේ දේශන පවත්වන්න සැලසුම් කරල තියෙනවා.තෙලිජ්ජවිල පුස්තකාල ගොඩනැගිල්ලට එහා පැත්තෙ හෝල් එකක් තියෙනවා.ඒක නිකන් තියෙන්නෙ.ඒකට යන්න පඩිපෙළක් හදල ඒ ගොඩනැගිල්ල තමයි අපි මේ කටයුත්තට යොදාගන්න බලාපොරොත්තු වෙන්නෙ.මේකෙන් ඒ පළාතටම ලොකු සේවයක් වෙනවා.ඒ වගේම ඒ ප්‍ර දේශයේ දියුණුවක් ඇති වෙනවා.ඇත්තටම වෙනි අකුල ආයුර්වේදයට හොරගොඩින්, ඇල්ගිරිටයන් , අකුරුගොඩින් එන්නෙ නැහැනේ. තෙලිජ්ජවිලත් දවස් දෙක තුනක් බෙහෙත් දෙනකොට ජනතාවට ලොකු සේවයක් සලසන්න පුලුවන්.

**<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>**

සභාපතිතුමා අපි දැනට පවත්වාගෙන යන ආයුර්වේදයෙත් ගොඩක් වෙලාවට බෙහෙත් නෑ.එතකොට මේ තවත් එකක් පටන්ගන්න කොහොමද මුදල් හොයාගන්නෙ.අපි මේ වැඩේට විරුද්ධ වෙනවා නෙමෙයි.එකතැනක බාගෙට වැඩ කෙරෙද්දී තවත් තැනක අලුතෙන් පටන් ගන්න හදන නිසයි කියන්නේ.මේකත් නැතිවෙලා ඒකත් නැතිවෙයිද දන්නෑ.මිනිස්සු බැන බැන යාවි.වෙනි අකුල ආයුර්වේදයෙ බෙහෙත් නෑ.සභාවෙන් පොඩි ගානයි දාල තියෙන්නෙ

ඒකට.මම කියන්නෙ මේකට ඇස්තමේන්තුවක් හදල වසරකට කොපමණ මුදලක් වැය වෙනවද? ඒ මුදල් යොදවන්නෙ කොහොමද? කියල අපිව දැනුවත් කළා නම් හොඳයි.අයවැයක් හදල ඒකත් එක්ක මේ යෝජනාව ආවනම් හොඳයි.

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

මම මේ ඔබතුමා කියන සියලු කාරණා ප්‍රතික්ෂේප කරනවා.ඒක සාධාරණ කාරණාවක් නෙමෙයි.බෙහෙත් මිලදී ගන්න කොට නිසි ක්‍රමවේදයක් තියෙනවා.කවදාවත් අපි ආයුර්වේදයට බෙහෙත් නොදී ඉඳලා නෑ.හැබැයි බෙහෙත් මිළදී ගන්නකොට අපි මහ සභා රැස්වීමට හරි මුදල් කමිටුවට හරි යෝජනාවක් දාලා අනුමැතියක් අරන් තමයි බෙහෙත් මිළදී ගන්න ඕන.බෙහෙත් නෑ කියල අද ලියුම ආවම හෙට වෙනකොට බෙහෙත් දෙන්නෙ කොහොමද? ක්‍රමවේදයට යනකොට පොඩි ප්‍රමාදයක් වුණත් කවදාවත් බෙහෙත් නොදී ඉන්නෙ නෑ.අපි තමයි මේ බෙහෙත් මෙහෙම හරි දෙන්නෙ.වෙන ආයුර්වේදවල බෙහෙත් පිටින් ගන්න දෙන්නෙ.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:5</u>**

ප්‍රාදේශීය සභාව සතු තෙලිජ්ජවිල පුස්තකාල ගොඩනැගිල්ලේ එක් කාමරයක ආයුර්වේද බෙහෙත් ලබා දීම සඳහා සායන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 5:6</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක සියලු පෙර පාසල් හි අධ්‍යාපනය ලබන 2022 වර්ෂයට පාසල් අධ්‍යාපනය ලැබීමට නික්ම යන දරුවන් සඳහා සහතික පත්‍රයක් ලබා දීමේ වැඩසටහන සඳහා රු**. 50,000.00** ක මුදල අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | වියදම් දරණු ලබන කාරණය | ස්ථානය | දිනය | සහතික පත්‍රලාභීන් සංඛ්‍යාව | දළ වියදම් ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| 01. | බල ප්‍රදේශයේ සියළු පෙර පාසල් හි අධ්‍යාපනය ලබන දරුවන් සඳහා සහතික පත්‍ර ලබා දීම | මාලිම්බඩ ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් | 500 | රු.100 × 500<br>**<u>රු.50,000.00</u>** |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:6</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක සියලු පෙර පාසල් හි අධ්‍යාපනය ලබන 2022 වර්ෂයට පාසල් අධ්‍යාපනය ලැබීමට නික්ම යන දරුවන් සඳහා සහතික පත්‍රයක් ලබා දීමේ වැඩසටහන සඳහා රු**. 50,000.00** ක මුදල අනුමත කිරීමට තීරණය විය.

| අනු අංකය | වියදම් දරණු ලබන | ස්ථානය | දිනය | සහතික පත්‍රලාභීන් | දළ වියදම් ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|

| | කාරණය | | | සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| 01. | බල ප්‍රදේශයේ සියළු පෙර පාසල් හි අධ්‍යාපනය ලබන දරුවන් සඳහා සහතික පත්‍ර ලබා දීම | මාලිම්බඩ ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් | 500 | රු.100 × 500<br>**රු.50,000.00** |

**යෝජනා අංක 5:7**

ලෝක ගුරු දින වැඩසටහන - 2022 යටතේ මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලු පෙර පාසල් ගුරුවරුන් සඳහා රස වින්දන කුසලතා ඉහළ නැංවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු. **32,000.00** ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | වියදම් දරණු ලබන කාරණය | ස්ථානය | දිනය | ප්‍රතිලාභීන් ගණන | දළ වියදම් ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| 01 | පෙර පාසල් ගුරුවරුන් සඳහා රස වින්දන කුසලතා ඉහළ නැංවීමේ වැඩසටහන සඳහා සංගීත උපකරණ සපයා ගැනීම හා අදාල ආචාර්යවරුන් සඳහා සම්පත්දායක දීමනා ගෙවීම් කිරීම | මාලිම්බඩ ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරය | 2022 ඔක්තෝබර් | 70 | 25,000.00 |
| 02 | සංග්‍රහ කටයුතු සඳහා තේ සහ කේක් ලබාදීම | | | | රු. 100 × 70 = 7,000.00 |
| | **එකතුව** | | | | රු. **32,000.00** |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

පෙර පාසල් ගුරුවරුන්ගෙ රසවින්දනය උදෙසා වැඩසටහනක් කරන්න කියල අපෙන් ඉල්ලීමක් කරල තියෙනවා.

**ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා**

මේ යෝජනාවට මම විරුද්ධයි. මුදල් විනාශ කරන දේවල් විතරයි කරන්නෙ.මෙහේ පාරවල්වල යන්න බැහැ බැද්ද වැවිලා.ලයිට් ටික නැහැ.ඒවා තියෙද්දි මේ බොරු දේවල් කරන්නෙ සේරම.එහෙම කළාම කෙහොමද මේ සභාව ගෙනියන්නෙ.සභාවේ නම ගහපු බෝඩ් එකක් දාන්න කියල මම අවස්ථා 03 කදී යෝජනා 03ක් දැම්මා.සභාවේ සල්ලි නෑ

කියල ඒවා ක්‍රියාත්මක වුණේ නෑ. ආයතන නම් වලින් මාර්ගවල බෝඩ් සවිකරල තියෙනවා. මේවායින් වෙන්නෙ ආයතනවලට ප්‍රසිද්ධියක් ලාබෙන එක.ඇයි සභා අරමුදලින් දාන්න බැරි? ලේකම් මිස් ඡන්ද විමසීමක් කරන්න.මම මේකට විරුද්ධයි.

<u>**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**</u>

සමන් මන්ත්‍රීතුමා, අපි හැමෝටම ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් තියෙනවා.ඕනම කෙනෙක් ඡන්ද විමසීමක් ඉල්ලුවොත් අපි ඒක ක්‍රියාත්මක කරනවා.මේ යෝජනා හොඳ නැත්නම් ඒවා ඉවත් කරන්නත් සභාවට බලය තියෙනවා.මේකට අපි නිකන් රණ්ඩු වෙන්න ඕන නෑ.කට්ටිය කැමති නම් කරමු.නැත්නම් ඉවත් කරමු.මම කියන්නෑ මේක ක්‍රියාත්මක කරන්නම ඕන කියලා.පෙර පාසල් වලින් ආපු අදහසක් තමයි මේ ඉදිරිපත් කරල තියෙන්නෙ.ක්‍රියාත්මක කරන නොකරන එක සභාවේ වගකීමක්.ලංකාවේ කිසිම තැනක සභා අරමුදල් වලින් සභාවේ නම තියෙන බෝඩ් එකක් ගහල නෑ.ඕනම තැනක ගිහින් බලන්න ඒක company එකකින් දාලා තියෙන්නෙ.අදාළ company එකේ නමත් තියෙනවා. මාලිම්බඩ විතරක් ඇයි අපි එහෙම කරන්නෙ.ව්‍යාපාරිකයන් ඇවිල්ල අපෙන් බෝඩ් එකක් දාන්න අවසර බල්ලුවම ඇයි අපි විරුද්ධ වෙන්නෙ.ඔබතුමාට ඒ තියෙන බෝඩ් එකක් ඉවත් කරල බෝඩ් එකක් දාන්න ඕන නම් සභාවට යෝජනාවක් ගේන්න.එතකොට මිළ ගණන් කැඳවල ඒක කරමු.

අදාල යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලන ලදුව ඡන්දය විමසන ලදී. එහිදී පහත නම් සඳහන් ගරු සභාපතිතුමා හා උපසභාපතිතුමා ඇතුළු ගරු සභික මහත්ම මහත්මීන් යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා - පක්ෂයි
- ගරු උපසභාපති පි.ජී. පාලිත කුමාර මහතා - පක්ෂයි
- ගරු සභික දික්මාදුගොඩගේ බන්දුල මහතා - පක්ෂයි
- ගරු සභික ලසන්ත රණසිංහ මහතා - පක්ෂයි
- ගරු සභික දිස්නා ධර්මවර්ධන මෙනවිය - පක්ෂයි
- ගරු සභික චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා - පක්ෂයි
- ගරු සභික රචිත මොහොට්ටි මහතා - පක්ෂයි
- ගරු සභික පෙරමුණගේ අජිත් නාලක මහතා - පක්ෂයි

එහිදී පහත නම් සඳහන් යෝජනාවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

- ගරු සභික සමන් දෙනිපිටියගේ මහතා
- ගරු සභික පිටිදුව ගමගේ විමලවංශ මහතා
- ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
- ගරු සභික ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
- ගරු සභික පන්නිගල ගමගේ තරංගා මිය

ඡන්දය විමසන අවස්ථාවේ පහත මන්ත්‍රීවරුන් සභාවේ නොසිටින ලදී.

- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
- ගරු සභික ගයාන් සමන්ත නාදකන්ද මහතා
- ගරු සභික ජී.පී. උදයශාන්ත මහතා මයා
- ගරු සභික ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

ඒ අනුව වැඩි ඡන්ද 03 කින් යෝජනාව සභා සම්මත විය.

ඒ අනුව එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:7</u>**

ලෝක ගුරු දින වැඩසටහන - 2022 යටතේ මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලු පෙර පාසල් ගුරුවරුන් සඳහා රස වින්දන කුසලතා ඉහළ නැංවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු. **32,000.00** ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

| අනු අංකය | වියදම් දරණු ලබන කාරණය | ස්ථානය | දිනය | ප්‍රතිලාභීන් ගණන | දළ වියදම් ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| 01 | පෙර පාසල් ගුරුවරුන් සඳහා රස වින්දන කුසලතා ඉහළ නැංවීමේ වැඩසටහන සඳහා සංගීත උපකරණ සපයා ගැනීම හා අදාල ආචාර්යවරුන් සඳහා සම්පත්දායක දීමනා ගෙවීම් කිරීම | මාලිම්බඩ ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරය | 2022 ඔක්තෝබර් | 70 | 25,000.00 |
| 02 | සංග්‍රහ කටයුතු සඳහා තේ සහ කේක් ලබාදීම | | | | රු. 100 × 70 = 7,000.00 |
| | **එකතුව** | | | | **රු. 32,000.00** |

**<u>යෝජනා අංක 5:8</u>**

අකුරුගොඩ මැදගොඩ පෙර පාසල අවම පහසුකම් යටතේ ඉතා දුෂ්කර ලෙස පවත්වාගෙන යන බැවින්, ළමා කාය වර්ධනය උදෙසා සෙල්ලම් මිදුලක් සෑදීමට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් තෙලිජ්ජවිල පොළ භූමියේ තිබෙන දැනට භාවිතයට නොගන්නා නාම පුවරු සැකිල්ල ඒ සඳහා ලබා දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

මෙම යෝජනාව ඉවත් කර ගන්නා ලදී.

6). යථා පරිදි කල් දී නොමැති යෝජනා.

**<u>යෝජනා අංක 6:1</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන වෙනි අකුල සායන මධ්‍යස්ථානයේ 2022 අවසන් කාර්තුව සඳහා ආයුර්වේද වෛද්‍ය නිලධාරී විසින් ඉල්ලීම් කරන ලද නිෂ්පාදිත ඖෂධ ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:1**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන වෙනි අකුල සායන මධ්‍යස්ථානයේ 2022 අවසන් කාර්තුව සඳහා ආයුර්වේද වෛද්‍ය නිලධාරී විසින් ඉල්ලීම් කරන ලද නිෂ්පාදිත ඖෂධ ලබා දීමට තීරණය විය.

**යෝජනා අංක 6:2**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු ලා නිල් පැහැති යකඩ බවුසරය භාවිතයට ගත නොහැකි බවට නිර්දේශ ලැබී ඇති බැවින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:2**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු ලා නිල් පැහැති යකඩ බවුසරය භාවිතයට ගත නොහැකි බවට නිර්දේශ ලැබී ඇති බැවින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට තීරණය විය.

**යෝජනා අංක 6:3**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කාර්යය මණ්ඩලය සහභාගී වන අධ්‍යයන චාරිකාවට අදාල ව්‍යාපෘති වාර්තාව අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:3**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කාර්යය මණ්ඩලය සහභාගී වන අධ්‍යයන චාරිකාවට අදාල ව්‍යාපෘති වාර්තාව අනුමත කිරීමට තීරණය විය.

**යෝජනා අංක 6:4**

ගොවිතැනට නිසිතැන - ගොවියාට අතහිත ව්‍යාපෘති වාර්තාව අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:4**

ගොවිතැනට නිසිතැන - ගොවියාට අතහිත ව්‍යාපෘති වාර්තාව අනුමත කිරීමට තීරණය විය.

**යෝජනා අංක 6:5**

134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල යටතේ එකී නිශ්චල දේපළ අතරින් කුඹුරු ඉඩම් හැර සෙසු සියලුම නිවාස වල ,ගොඩනැගිලිවල,ඉඩම් වල හා ගෙපත් වල වාර්ෂික වටිනාකමෙන් සියයට හයක (6%)ක් ලෙස අයකළ වරිපනම් බද්ද 6%-10% දක්වා වැඩි කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:5</u>**

134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල යටතේ එකී නිශ්චල දේපළ අතරින් කුඹුරු ඉඩම් හැර සෙසු සියලුම නිවාස වල ,ගොඩනැගිලිවල,ඉඩම් වල හා ගෙපත් වල වාර්ෂික වටිනාකමෙන් සියයට හයක (6%)ක් ලෙස අයකළ වරිපනම් බද්ද 6%-10% දක්වා වැඩි කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:6</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත බැකෝ ලෝඩර් ක්‍රියාකරු ලෙස සේවය කරන ඒ.වී.අමිල් උෂාන්ත මයා සේවා කාලය 2022/08/24 දිනෙන් අවසන් වන බැවින් ඔහුගේ සේවා කාලය වසරකින් දීර්ඝ කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:6</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත බැකෝ ලෝඩර් ක්‍රියාකරු ලෙස සේවය කරන ඒ.වී.අමිල් උෂාන්ත මයා සේවා කාලය 2022/08/24 දිනෙන් අවසන් වන බැවින් ඔහුගේ සේවා කාලය වසරකින් දීර්ඝ කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:7</u>**

අකුරුගොඩ නැගෙනහිර මැදගොඩ ප්‍රජා ශාලාවෙහි ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් වෙනුවෙන් පවත්වනු ලබන පෙර පාසල සඳහා වැසිකිලි පහසුකම් සහ සෙල්ලම් මිදුලක් සකස් කර දීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:7</u>**

අකුරුගොඩ නැගෙනහිර මැදගොඩ ප්‍රජා ශාලාවෙහි ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් වෙනුවෙන් පවත්වනු ලබන පෙර පාසල සඳහා වැසිකිලි පහසුකම් සහ සෙල්ලම් මිදුලක් සකස් කර දීමට අවශ්‍ය ද්‍රව්‍ය සභාව මගින් ලබා දීමටත්, ඒ සඳහා අවශ්‍ය ශ්‍රම දායකත්වය ප්‍රදේශවාසී ජනතාවගෙන් ලබා ගැනීමටත් තීරණය විය.

**<u>යෝජනා අංක 6:8</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් වල සිටින ආර්ථික අපහසුතා හේතුවෙන් සිය අධ්‍යාපන කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමට නොහැකි සිසු දරු දැරියන් 30 දෙනෙකු වෙනුවෙන් එක් අයෙකු සඳහා මසකට **රු.2000** බැගින් මාස 02ක කාලයක් සඳහා ශිෂ්‍යාධාර මුදලක් ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් **රු.120,000.00** ක මුදල අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

එක් ශිෂ්‍ය/ශිෂ්‍යාවක් සඳහා මසකට රු. 2000 බැගින්

මාස 02ක කාලයක් සඳහා සිසුන් 30 ක් වෙනුවෙන් ආධාර මුදල්

ලබාදීම සඳහා වියදම = රු. 2000 X 02 X 30

= **රු. 120,000.00**

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය අංක 6:8**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් වල සිටින ආර්ථික අපහසුතා හේතුවෙන් සිය අධ්‍යාපන කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමට නොහැකි සිසු දරු දැරියන් 30 දෙනෙකු වෙනුවෙන් එක් අයෙකු සඳහා මසකට **රු.2000** බැගින් මාස 02ක කාලයක් සඳහා ශිෂ්‍යාධාර මුදලක් ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් **රු.120,000.00** ක මුදල අනුමත කිරීමට තීරණය විය.

එක් ශිෂ්‍ය/ශිෂ්‍යාවක් සඳහා මසකට රු. 2000 බැගින්
මාස02ක කාලයක් සඳහා සිසුන් 30 ක් වෙනුවෙන් ආධාර මුදල්
ලබාදීම සඳහා වියදම = රු. 2000 X 02 X 30

= **රු. 120,000.00**

**යෝජනා අංක 6:9**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ සභා සර්භය සඳහා විධායක පුටු 17ක් මිළදී ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:9**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ සභා සර්භය සඳහා විධායක පුටු 17ක් මිළදී ගැනීමට තීරණය විය.

**යෝජනා අංක 6:10**

ඕපිට පාර ආරම්භක ස්ථානය ජනතා සහභාගීත්වයෙන් නිම කිරීම සඳහා අවශ්‍ය සිමෙන්ති කළු ගල් වැලි සැපයීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ස්ථිර කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:10**

ඕපිට පාර ආරම්භක ස්ථානය ජනතා සහභාගීත්වයෙන් නිම කිරීම සඳහා අවශ්‍ය සිමෙන්ති කළු ගල් වැලි සැපයීමට තීරණය විය.

**යෝජනා අංක 6:11**

ගලවා ඉවත් කරන ලද කැටගල් මැදගොඩ කැකිල්ලකැටිය මාර්ගයට ඇතිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:11**

ගලවා ඉවත් කරන ලද කැටගල් මැදගොඩ කැකිල්ලකැටිය මාර්ගයට ඇතිරීමට තීරණය විය.

**යෝජනා අංක 6:12**

සුල්තානාගොඩ-දකුණ ග්‍රාම නිලධාරී වසමේ මහවෙල්ල ආරම්භයේ සිට කෝදැහිදූව දක්වා මාර්ගයේ ජල නල කාණු වැසීමට පස් සපයා ගැනීම වෙනුවෙන් එක් දිනක් සඳහා ටිපර් රථයක් ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:12**

සුල්තානාගොඩ-දකුණ ග්‍රාම නිලධාරී වසමේ මහවෙල්ල ආරම්භයේ සිට කෝදැහිදූව දක්වා මාර්ගයේ ජල නල කාණු වැසීමට පස් සපයා ගැනීම වෙනුවෙන් එක් දිනක් සඳහා ටිපර් රථයක් ලබා දීමට තීරණය විය.

**යෝජනා අංක 6:13**

මාර්ග සංවර්ධනය කිරීමට අදාළ පහත ඇස්තමේන්තු අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

- නාමල් මාවත ඉතිරි කොටස සංවර්ධනය කිරීමට අදාළ රු.124200.00 ක ද්‍රව්‍ය ඇස්තමේන්තුව
- පොල්පිටිය මාර්ගයේ කඩා වැටී ඇති පස් ඉවත් කිරීම සහ ඉවුරු ක්‍රමවත්ම සකස් කිරීම සඳහා වන රු.37200.00 ක වියදම් ඇස්තමේන්තුව
- ගලවා ඉවත් කරන ලද කැටගල් අරලිය මාවත හරස් මාර්ගයට ඇතිරීමට අදාළ රු.90000.00 ක වියදම් ඇස්තමේන්තුව
- ගලවා ඉවත් කරන ලද කැටගල් වෙල්ලගාවවත්ත රාජ මහතාගේ නිවස අසල සිට අයි.ජී.නාලක ප්‍රදීප් මහතාගේ නිවස දක්වා මාර්ගයේ ඇතිරීමට අදාළ රු.130000.00ක වියදම් ඇස්තමේන්තුව.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:13**

මාර්ග සංවර්ධනය කිරීමට අදාළ පහත ඇස්තමේන්තු අනුමත කිරීමට තීරණය විය.

- නාමල් මාවත ඉතිරි කොටස සංවර්ධනය කිරීමට අදාළ රු.124200.00 ක ද්‍රව්‍ය ඇස්තමේන්තුව
- පොල්පිටිය මාර්ගයේ කඩා වැටී ඇති පස් ඉවත් කිරීම සහ ඉවුරු ක්‍රමවත්ම සකස් කිරීම සඳහා වන රු.37200.00 ක වියදම් ඇස්තමේන්තුව
- ගලවා ඉවත් කරන ලද කැටගල් අරලිය මාවත හරස් මාර්ගයට ඇතිරීමට අදාළ රු.90000.00 ක වියදම් ඇස්තමේන්තුව

- ගලවා ඉවත් කරන ලද කැටගල් වෙල්ලගාවවත්ත රාජ මහතාගේ නිවස අසල සිට අයි.ජී.නාලක ප්‍රදීප් මහතාගේ නිවස දක්වා මාර්ගයේ ඇතිරීමට අදාළ රු.130000.00ක වියදම් ඇස්තමේන්තුව.

**<u>යෝජනා අංක 6:14</u>**

තෙලිජ්ජවිල කෘෂි පුහුණු මධ්‍යස්ථානය ඉඩමෙන් ආරම්භවී කිරිමැටිමුල්ල කැරැන්තොල්ල මාර්ගයෙන් අවසන් වන කැරැන්තොල්ල ඉහළදෙනිය මාර්ගය ප්‍රාදේශීය සභාවේ මාර්ගයක් ලෙස ලියාපදිංචි කිරීමට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:14</u>**

තෙලිජ්ජවිල කෘෂි පුහුණු මධ්‍යස්ථානය ඉඩමෙන් ආරම්භවී කිරිමැටිමුල්ල කැරැන්තොල්ල මාර්ගයෙන් අවසන් වන කැරැන්තොල්ල ඉහළදෙනිය මාර්ගය ප්‍රාදේශීය සභාවේ මාර්ගයක් ලෙස ලියාපදිංචි කිරීමට තීරණය විය.

**7). කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.**

2022/07/12 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම
2022/08/02 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම
2022/08/09 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම

**8). ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

**9). වෙනත් කරුණු-** නැත.

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 3.00 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව